# ඉතිහාසය හැදෑරීමේදී අභිලේඛන මූලාශ්‍රයන්හි දායකත්වය

ජේ.ආර්.අයි. ජයලත්[21]

---

වර්තමානයේ භාවිත වන ලේඛන කලාව මානව ඉතිහාසය තරමට ම පැරණි නොවුන ද ඒ සඳහා වසර දහස් ගණනක ඉතිහාසයක් පවතින බව අභිලේඛනඥයින්ගේ මතය වී තිබේ. මානව ඉතිහාසය දෙස හැරී බැලීමේදී ප්‍රාග් ඓතිහාසික මානවයාගේ පටන් ඔවුන් තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා විවිධ උපක්‍රම භාවිත කර ඇත. කෝටු කැබලි වැනි ද්‍රව්‍ය භාවිත කරමින් පොළවෙහි හෝ වැලිතලා මත රූපසටහන් අඳිමින් ඔවුන් ලේඛනය සඳහා මුල පුරා ඇතිබවක් උපකල්පනය කළ හැකි ය. කාලයාගේ ඇවෑමෙන් ලේඛනය පරිනාමය වී අදහස් ප්‍රකාශ කිරීම සඳහා අක්ෂර කලාවක් බිහි වී ඇත. ලේඛනයට හුරුවූ මානවයා විවිධ ද්‍රව්‍යයන් මතුපිට තම අදහස් ලේඛනය කළ අතර ඒවා " අභිලේඛන" ලෙසින් හැඳින්වෙයි. ඒ අනුව අභිලේඛන යනු "යමක මතුපිට සටහන් කරන ලද" ලෙසින් සරල ව අර්ථකතනය කළ හැකි ය. මෙසේ පුරාණ අවදියෙහි දී විවිධ මැටි පුවරු ආදිය අභිලේඛන වශයෙන් මානවයා භාවිත කළ අතර එය ක්‍රමයෙන් පරිනාමය වීමත් සමග ගල් පුවරු, ලොහ පත්‍ර, ශාක පත්‍ර සහ මැටි බඳුන් ආදී වෙනත් ද්‍රව්‍යයන් ආදියෙහිත් ලේඛන කටයුතු සිදු කර ඇති ආකාරයක් දක්නට හැකි අතර ඒ සඳහා උදාහරණ ලෙසින් වල්ලිපුරම් රන් සන්නස, පනාකඩුව තඹ සන්නස, පැරණි පුස්කොල පොත් මැටි පාත්‍ර ආදිය සඳහන් කළ හැකි ය. මේ අයුරින් ලේඛනය වී ඇති අභිලේඛනයන් කුමන පදනමක් මත පැරණි මානව සමාජය විසින් රචනා කළේ ද යන්න පිළිබඳ ව විමසා බැලීමේ දී ගම්‍ය වනුයේ යමක අයිතියක් හැගවීමට මෙන් ම විනෝදාස්වාදය සඳහා ආදී වූ තවත් කරුණු කිහිපයක් ම මුල් කර ගනිමින් රචනා කර ඇති බවයි. සීගිරි කුරුටු ගී එසේ විනෝදාස්වාදය සඳහා රචනා වී ඇත. අභිලේඛනයන් විමර්ශනය කර බැලීමේදී පසක්වන කරුණක් වන්නේ ලේඛන කලාව මේ වන විට යුග ගණනාවක් පසුකර ඇති බවයි. වර්තමානයේ හා ඒ ආසන්න කාල සීමාවන්හි දී ලියවී ඇති ලේඛන පිළිබඳ ව අධ්‍යයනය කිරීමට සාමාන්‍ය සාක්ෂරතාවක් ඇති පුද්ගලයෙකුට වුවද හැකි වුව ද පැරණි තත්ත්වයේ ඇති අභිලේඛනයන් අධ්‍යයනය කිරීමට ඔවුන් අපොහොසත් ය. ඒ සඳහා ම විශේෂිත වූ පිරිසක් අභිලේඛන අධ්‍යයන කටයුතු සිදු කරන අතර ඔවුන් **"අභිලේඛනඥයින්"** ලෙසින් හඳුන්වනු ලැබේ. එම අභිලේඛනඥයන් කිහිප දෙනෙකු ලෙසින් එච්.සී.පී. බෙල්, සෙනරත් පරනවිතාන, සිරිමල් රණවැල්ල, එල්ලාවල මේධානන්ද හිමි යන විද්වතුන් සඳහන් කළ හැකි ය. අභිලේඛන අධ්‍යයනය කිරීම හරහා යම් රටක යටගියා වූ ආර්ථික, දේශපාලන, ආගමික හා සාමාජීය තත්වයන් පිළිබඳ ව තොරතුරු ගවේෂණය කිරීමට හැකිවන අතර මෙම අභිලේඛනයන්හි ප්‍රධානතම වැදගත්කම් වනුයේ ඒවා සමකාලීන වීමත් එමෙන්ම තවකෙකුගේ සිතැඟි පරිදි යම් යම් වෙනස් කිරීම් සඳහා භාජනය කිරීමට නොහැකි වීමත් එසේ යම් වෙනසකට භාජනය කරනු ලබන්නේ නම් ඒබ ව සැඟවීමට අපහසු වීමත්ය. ඒ අනුව ඉතිහාසය හැදෑරීමේදී අභිලේඛන මූලාශ්‍ර දක්වන දායකත්වය ඉතාමත් වැදගත් වූවක් බව සඳහන් කළ හැකි ය.

ප්‍රමුඛ පද: මූලාශ්‍ර, අභිලේඛනය, අභිලේඛනඥයා

---

21 මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, jrindika910@gmail.com.